# එදා 'ගම දුව' දැන් ඇමෙරිකාවේ කථිකාචාරිනියක්



**ලක්ෂ්මි** දමයන්ති ප්‍රවීණ රංග ශිල්පිනිය වඩාත් ජනප්‍රිය වුණේ වේදිකාව හරහායි. දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ හරි බැහා ගම දුව ලෙස දීර්ඝ කාලයක් ප්‍රේක්ෂකයන් අතරට ආ ඇය පසුව බන්ධුල ජයවර්ධනගේ රතු හැට්ටකාරි ඇතුළු වේදිකා නාට්‍ය කීපයකම චරිත නිරූපණය කළාය. පසුව රැජිණ, දඬුබස්නාමානය, අකාලසන්ධ්‍යා, දූ දරුවෝ ඇතුළු ටෙලි නාට්‍ය ගණනාවකට දායක වූ ලක්ෂ්මි දමයන්ති පසුගිය කාලයේ දී දැක ගත නොහැකි වූ අතර කාලයකට පසුව නැවතත් ඇය ආලින්දයට පැමිණ සිටින මොහොතකි මේ. ඒ සුදත් දේවප්‍රිය රචනය කොට අධ්‍යක්ෂණය කළ ලක්ෂ්මි දමයන්ති විසින්ම නිෂ්පාදනය කළ "සුළඟ මහ මෙරක" ටෙලි මාලාව සමගය. එහි අනුලාවති ලෙස චරිතයකට ද දායකව සිටින ආචාර්ය ලක්ෂ්මි දමයන්ති සඳැල්ලට පැමිණි මොහොතකි මේ.



**• පසුගිය කාලයේ දි පෙනෙන්නට නොසිටියේ?**

ලංකාවේ දී මම උපාධියක් ලබාගෙන තිබුණේ. පසුව නාට්‍ය හා රංග කලාව පිළිබඳව ආචාර්ය උපාධිය වෙනුවෙන් ඇමරිකාවට ගියා. 2008 දී මම ලංකාවෙන් ගියේ. නාට්‍ය හා රංග කලාව වෙනුවෙන් ආචාර්ය උපාධිය ලබා ගත්තට පසුව දැන් කථිකාචාර්යවරියක ලෙස සේවය කරනවා.

**• ලංකාවේ දී මොන අංශයෙන් ද උපාධි ගත්තේ?**

ලංකාවේදී මගේ ප්‍රථම උපාධිය ලබා ගත්තේ කොළඹ සරසවියෙන්. පසුව කැලණි සරසවියෙන් නාට්‍ය හා රංග කලා අංශයෙන් ඒ උපාධිය ලබා ගත්තා. ඊට අමතරව ජයවර්ධනපුර සරසවියෙන් ලේඛකත්ව හා ජන සන්නිවේදනය පිළිබඳව ඩිප්ලෝමාව කළා. එවැනි අධ්‍යාපනයක් එක්ක තමයි ඇමරිකාවට ගියේ.



**• ඇයි ඇමරිකාවට යන්න හිතුණෙ?**

නාට්‍ය කලාවේ මම ආදරය ගෞරවය කළ කෙනෙක් නිසා මට ලොකු අසාධාරණයක් වුණා. ඒ නිසා මට ඒ ගැන ඇති වූ කළ කිරීම නිසා රටෙන් යන්න තීරණය කළා. මම ගියේ විශාල හිත් රිදවීමක් වූ නිසයි. ඒ වේදනාව අදටත් මට තියෙනවා. මම අද මගේ විෂය අංශයෙන් ඉතාම ඉහළ තැනක සිටියත් එදා ඒ සිදු වූ දේ නිසා මම හරියට කම්පාවට පත් වුණා.

**• කොහොමද පුද්ගලික තොරතුරු?**

මට දැන් දියණියක් සිටිනවා. ඇය ඇමරිකාවේ සරසවියකින් උසස් අධ්‍යාපනය හදාරා එයාගෙම ව්‍යාපාරයක් කරගෙන යනවා.

**• ඔබගේ සැමියා කලාවට සම්බන්ධ කෙනෙක් ද?**

පුංචි කාලයේ දී මා එක්කම රඟපාලා තියෙනවා. ඊට අමතරව තව තව නාට්‍යවලට දායක වුණා. අධ්‍යාපනය එක්ක එයා මෝස්තර නිර්මාණ අංශයෙන් ගමනක් ගියා. අද මම සැනසීමෙන් සාමයෙන් ජීවිතය ගෙවනවා. දිරියෙන් ජීවිතය දිනූ වූ ගැහැනියක් කියලා මට සතුටු වෙන්න පුළුවනි.

**• ඇමරිකාවේ ගෙවන ජීවිතය මොන වගේ ද?**

ඇමරිකාව කියන්නේ විවිධ ජාතීන් ජීවත් වන රටක්නේ. මම කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරන සරසවිය පිහිටලා තියෙන්නේ අක්කර 180ක පමණ භූමියක. සිසුන් 18,000 ක් විතර සිටින සරසවියක්. එහි පදිංචි ලාංකීය දරුවන් පවා මගෙන් ඉගෙනීම ගැන මට ආඩම්බරයක් වගේම සතුටක් තියෙන්නේ. මට මේ ඔක්කෝම ලැබුණේ ලංකාවෙන් ලැබුණු අධ්‍යාපනය නිසයි. ඒ ගෞරවය තියාගෙන මම ඇමරිකාවේ ගත කරන්නේ ප්‍රීතිමත් ජීවිතයක්.

## ලක්ෂ්මි දමයන්ති



**• ඒ අතරේ ලංකාවට ඇවිත් ඇයි ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කරන්න හිතුවේ?**

ඒක මගේ සිහිනයක්. හොඳ නිර්මාණයකට දායක වීමේ අරමුණ ඇතිව පසුගිය වසරේ ලංකාවට ආවා. "සුළඟ මහමෙරක" හරි අපූරු නාට්‍යයක්. අඹ යහළුවෝ නාට්‍යයට පසුව සුදත් දේවප්‍රිය මහතා රචනය කොට අධ්‍යක්ෂණය කරන මේ අපූරු නිර්මාණයට නිෂ්පාදනයෙන් දායක වුණා. ප්‍රවීණ රංග ශිල්පීන් වන හේමසිරි ලියනගේ, ජයනි, බිමල්, ධර්මප්‍රිය ඩයස්, සුමිත් රත්නායක, දමිතා, ආනන්ද අතුකෝරළ, ආනන්ද කුමාර උන්නැහේ සමග වොල්ගා කල්පනී, තරින්දි ප්‍රනාන්දු, චන්ද්‍රිමා කරුණාදාස සමග මාත් චරිතයක් රඟපානවා.

**• "සුළඟ මහමෙරක" ඔබ රඟපාන චරිතය ගැන කිව්වොත්?**

එහි මගේ නම අනුලාවති. පවුලක වැඩිමල් දියණියක්. ඇය අවිවාහකයි. 89 භීෂණ සමයේ සිදු වූ කතාවක්. පවුලේ වැඩිමලා ලෙස අනුලා බොහෝ දුක් උහුලාගෙන ඒ පවුල බැලන්ස් කරගෙන යන චරිතයක්. මෙහි කැමරාකරණයෙන් සිසිර පරණවිතාන, සංගීතයෙන් තරුපති මුණසිංහ සහ අංග රචනයෙන් වසන්ත පූර්ණවංශ දායක වූ මේ නාට්‍යය නරඹන්න කියලා මම ආදරණීය ප්‍රේක්ෂකයන්ට කියනවා.

**• ලක්ෂ්මි අද වේදිකාවේ රඟපාන්නේ නැද්ද?**

මම මෙහේ එන්නෙ වසරකට දෙපාරක් විතර අම්මා බලන්න ඕනෑ නිසයි. වසරකට දෙපාරක් විතර සරසවි නිවාඩු ලැබුණට පස්සේ මෙහෙ එනවා. අපි සල්ලි ඉතිරි කළාට වැඩක් නැහැ. අම්මා තාත්තාගේ සැනසීම දරුවෝ දකින එකයි. ඒනිසා සල්ලි ගැන නොසිතා අපි ඒ යුතුකම කරන්න ඕනෑ.

**• දැන් මේ "සුළඟ මහමෙරක" නාට්‍යයට ලැබෙන ප්‍රතිචාරය කොහොම ද?**

මෙය විකාශය වන්නේ සෙනසුරාදා ඉරිදා රාත්‍රී 8.30ට. ඉතා හොඳ ප්‍රතිචාර ලැබෙන්නේ.

**• "ලක්ෂ්මි" කොහොම කෙනෙක් ද?**

ඇත්ත කතා කරන , ඇත්තට ගරු කරන ඉතා සංවේදී ගැහැණියක්.

## 'සුළඟ මහ මෙරක' භීෂණ සමය ගැන කතාවක්

සටහන/ඡායාරූප: සඳුන් ගමගේ